ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

# ද්විපාර්ශවික ආරක්ෂක සහයෝගීතාවයේ ශක්තිමත්ම සහ වඩාත් ස්ථිරසාර කුළුණ පුහුණු වීම් වේ : නියෝජ්‍ය මහ කොමසාරිස්

නියෝජ්‍ය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා 2023 පෙබරවාරි 28 වන දින කොළඹ දී ඉන්දීය නාවික හමුදාවට අයත් සුගන්‍යා නෞකාවේ දී ඉන්දියානු නාවික හමුදාවේ පුහුණුව ලද ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සාමාජිකයන් ඇමතීය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශවික ආරක්ෂක සහයෝගීතාවයේ ශක්තිමත්ම සහ වඩාත් ස්ථිරසාර කුළුණ පුහුණුවීම් බව එතුමා මෙහිදී ප්‍රකාශ කළේය. ඇමරිකානු ඩොලර් මිලියන 7ක වාර්ෂික ප්‍රතිපාදනයක් සහිත විශේෂ වැඩසටහනක් හරහා ඉන්දියානු ආරක්ෂක අංශ සෑම වසරකම පුහුණු අවස්ථාවන් 1500ක් පමණ ශ්‍රී ලංකාවට පිරිනමන බව නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා සඳහන් කළේය.

2. ජාතික ආරක්ෂක විද්‍යාලය, ඉන්දියානු හමුදා ඇකඩමිය, ගුවන් හමුදා ඇකඩමිය සහ ඉන්දියානු නාවික හමුදා ඇකඩමිය වැනි ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ ආරක්ෂක ආයතනයන් හිදී කැඩෙට් නිලධාරීන්ට පුහුණුව ලබා දේ. මෙයට අමතරව, විවිධ සේවා සඳහාම අදාළ පුහුණු මොඩියුල සහ කාර්ය මණ්ඩල

පාඨමාලා ද පිරිනැමේ. උසස් ආරක්ෂක කළමනාකාරණ සහ ජාතික ආරක්ෂක විද්‍යාල පාඨමාලාවන් හි වැඩිම අවස්ථාවන් ද ශ්‍රී ලංකාවට හිමි වේ. ඉන්දීය ආරක්ෂක ආයතනවල පුහුණුව ලද ඇතැම් ආදි විද්‍යාර්ථයන් ශ්‍රී ලංකා හමුදා ප්‍රධානීන් බවට පත්ව තිබීම ඉන්දියාවට ඉමහත් සතුටක් බව නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා සඳහන් කළේය.

3. නියෝජ්‍ය මහ කොමසාරිස් ජේකබ් මහතා ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා විශිෂ්ට මට්ටමක පවතින බව ද එය ඉන්දියාවේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය තීව්‍ර කරන බව ද පැවසීය. දෙරටම සියලු අංශයන් හි සබඳතා වඩා ශක්තිමත් කිරීමට කටයුතු කරන අතර කෙටි හා මධ්‍ය කාලයේ දී අංශ පහකට වැඩි වැදගත්කමක් හිමි වේ. 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ ජනතාවට ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියන 4ක සහයෝගය ඉදිරියට ගෙන යමින් තවදුරටත් ආර්ථික සහ මූල්‍ය සහයෝගීතාවය ලබා දීම එයින් පළමුවැන්න වේ. මෙහි දී ජාතික මුදල් ඒකකයන් හරහා වෙළඳාම, ආයෝජන පහසුව සහ මූල්‍ය සහයෝගීතාවය ශක්තිමත් කිරීම වැනි අංශ කෙරෙහි අවධානය යොමු කළ හැකි බව එතුමා පෙන්වා දුන්නේය. දෙවනුව, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ගුවන්, සමුද්‍රීය, ඩිජිටල් සහ බලශක්ති සම්බන්ධකතාවය ඉහළ නැංවීම සඳහා කටයුතු කරමින් සිටියි. තෙවනුව දුර්වල ප්‍රජාවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් දැනට පවතින බිලියන ගණනාවක සංවර්ධන සහයෝගීතාවය නව ආරකින් දියුණු කිරීමේ අවශ්‍යතාවය පවතී. සිව්වෙනුව, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව දෙරට ජනතාව අතර සබඳතා ශක්තිමත් කළ යුතුය. පස්වෙනුව, දෙරට අතර සංස්කෘතික,

ආගමික, සංගීතමය, සිනමා සහ ක්‍රීඩා සබඳතා ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

***

***කොළඹ***
***2023 මාර්තු 1***